# කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර-2019

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය-I

(පැ. තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව : 07

ඕනෑම ප්‍රශ්න **<u>හතරකට (04) පමණක්</u>** පිළිතුරු සපයන්න.

(විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය, නීතියේ බලය නම් මූලධර්මයට සීමා වී නොමැත. නීතියේ බලය ප්‍රාථමික වශයෙන් බලය අත්තනෝමතික ලෙස භාවිතා කිරීම සීමා කිරීමට හෝ හැකිනම් මුලිනුපුටා දැමීම කෙරෙහි ඉලක්කගත වී ඇත. අනෙක් අතට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය භාවිතයේදී, එහි වපසරිය වඩාත් පුළුල් වේ.

   ඔබ එකගවන්නෙහිද? අදාල නඩු තීන්දු අධිකාරීන් හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අදාල ප්‍රතිපාදනයන් ගෙන් උදාහරණ ගෙන ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

2. වත්මන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පාලනය පිළිබද අවබෝධ කරගැනීමේදී වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉන් පෙර පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ද්විත්වය සමග සංසන්දනය කිරීමට දරන්නා වූ උත්සාහයන්ගේ බලපෑමට ලක් වී තිබේ. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ත්‍රිත්වයම බලතල බෙදීම, අධිකරණ ස්වාධීනතාවය සහ තනිපුද්ගල ස්වායත්තතාවය සම්බන්ධයෙන් කටයුතු කර තිබුනද, ඒවායෙහි අන්තර්ගතය හා භාවිතාව මගින් ඒවා මුළුමනින් ම එකිනෙකට වෙනස් වේ.

   ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ත්‍රිත්වයෙන් උදාහරණ ගෙනහැර දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. ඔබගේ පිළිතුර නඩු තීරණ මගින් සනාථ කළ යුතුය.

3. බලතල බෙදීමේ සිද්ධාන්තය, බලය අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීමට චේතනා කරනු ලබයි. කෙසේවුවද, එමගින්, රාජ්‍යයේ අංග ත්‍රිත්වය හුදකලාව හෝ සම්පූර්ණයෙන් ඒකක වලට වෙන්වී ක්‍රියාත්මකවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදයක් තුල තවදුරටත් ප්‍රායෝගික නොවේ.

අදාල නඩු තීරණ අධිකාරීන් හා අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයන් ගෙනහැර දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න. ශ්‍රී ලංකාවෙන් හා ඔබ කැමති වෙනත් එක් අධිකරණ ක්ෂේත්‍රයකින් උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

4. *ලකා යනු පොදුරාජ්‍ය මණ්ඩලීය රටකි. 2016 වසරේදී ලකා හී විධායක ජනාධිපතිවරයා* වන ලොකී මහතා, ලකා හී අගවිනිසුරු වශයෙන් ගරු විජය මහතාව පත් කරන ලදී. මෙම පත්කිරීම, වඩාත් ජ්‍යෙෂ්ඨ හා අගවිනිසුරු තනතුරට පත්වීමට ඊළගට සුදුසුකම් සපුරා සිටි , වියා විනිසුරුවරිය නොසලකා හැර සිදුකරන ලද්දක් බව මහත්සේ ප්‍රසිද්ධියට පත්විය. තවදුරටත්, වාර්තා වී තිබුනේ, වැඩ භාර ගැනීමට පෙර විජය විනිසුරුතුමාට දින නොදැමූ ඉල්ලා අස්වීමේ ලිපියක් අත්සන් කිරීමට බලකර තිබූ බවයි. අගවිනිසුරු විජයට එරෙහිව දෝශාභියෝග ක්‍රියාවලිය ආරම්භ කිරීමට ලෝකී මහතාට අවශ්‍යව තිබූ බවට චෝදනා කෙරී තිබුණි.

' ***ලක් මෝර්නිංග් ස්ටාර්*** නම් පුවත්පතෙහි මෑතකදී පලවූ ලිපියක් දක්වන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වැටුප් අඩුකරන බවට හා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සදහන් විශ්‍රාම වයසට ලගාවීමට පෙර තෝරාගත් විනිසුරන් ප්‍රමාණයක් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමක් සිදුකරන බවට තර්ජනය කර ඇති බවයි. මෙම තර්ජනයන් සිදුකර ඇත්තේ, ජනාධිපතිවරයාගේ ධුර කාලය දීර්ඝ කර ගැනීම සදහා පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් විවාදයට ලක් වෙමින් තිබෙන අතරතුර බව වාර්තා විය.

ලකා හී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පාලන ක්‍රමය ශ්‍රී ලංකාවට සමාන බව උපකල්පනය කරන්න. ඉහත සිදුවීම අධිකරණයේ ස්වාධීනතාවය ආශ්‍රිතව සලකා බලන්න. අවශ්‍ය

අවස්ථාවන්හිදී, ඔබගේ පිළිතුර, අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනයන්, නඩු තීරණ අධිකාරීන් සහ වෙනත් අදාල අවස්ථාපිත උදාහරණයන්ගෙන් සමන්විත විය යුතුය.

5. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පාලනය විෂයෙහි දිගුකාලයක පටන් පැවති සාධනීය ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දෙන ලදී. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දුන්නද, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ හැකි ප්‍රධාන බලතලයන් තවදුරටත් නොවෙනස්ව පවතී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනයන් ආශ්‍රිතව ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න. මෑත කාලීන උදාහරණ මගින් ඔබගේ පිළිතුර සනාථ කළ යුතුය.

6. සමන් රාජ්‍ය පරිපාලන නිලධාරියකු වන අතර, කාන්තා හා පුරුෂ සමලිංගික, ද්විලිංගික හා සංක්‍රාන්ති ලිංගික සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයෙකි. ඔහු කාන්තා හා පුරුෂ සමලිංගික, ද්විලිංගික හා සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරන ප්‍රබල ක්‍රියාකාරිකයෙකි. සමන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිපාලන අධ්‍යක්ෂක තනතුරුට අයදුම් කළ අවස්ථාවේදී, අමාත්‍යාශයේ ලේකම්වරයා වන රාජ් මහතා, සමන් අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා තිබියදීත් ඔහුට තනතුර ප්‍රදානය :කිරීම ප්‍රතික්ෂේප කළේය. සම්මුඛ පරීක්ෂණයට එතරම් හොඳින් මුහුණ දී නොතිබුනද, කාන්තා හා පුරුෂ සමලිංගික, ද්විලිංගික හා සංක්‍රාන්ති ලිංගිකයන්ට විරුද්ධ මතවාදයන්ට ප්‍රසිද්ධියක් උසුලන, පෙරේරාට තනතුර ලබා දෙන ලදී. සම්මුඛ පරීක්ෂණයට සතියකට පෙර, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ප්‍රිය සම්භාෂණයකදී රාජ් , සමන්ගේ ලිංගික නැඹුරුතාවය පිළිබද අවමන් සහගත අදහස් ප්‍රකාශ කරමින් සමන්ට අපහාස කළේය.

ලේකම්වරයාගේ තීරණයට එරෙහිව කිසියම් ප්‍රතිකර්මයක් තිබේදැයි දැන ගැනීමට සමන් ඔබගේ උපදෙස් පතයි. සමන්ට උපදෙස් දෙන්න.

7. **<u>අ හෝ ආ සඳහා පමණක්</u>** පිළිතුරු සපයන්න.

අ) ශ්‍රී ලංකාව, නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය භාවිතයට ගනු ලබන දකුණු ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රයන්ගෙන් එකකි. කෙසේවුවද, විධායකයට මෙන්ම ව්‍යවස්ථාදායකයට තරඟ වැදීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දක්වා ඇති සුදුසුකම්, විධායකයට සහ ව්‍යවස්ථාදායකයට සුදුසු නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ප්‍රමාණවත් නොවන මට්ටමක පවතී. මෙම අඩුපාඩුව මගින්ද ජනතාව සතු පරමාධිපත්‍ය බලය යටපත් කරයි.

අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනයන් ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

**-හෝ-**

ආ) ජනමතවිචාරණය, ජනතාවට ස්වකීය ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසන එක් ක්‍රමවේදයකි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනමතවිචාරණයකදී ඡන්දය භාවිතා කිරීමට ජනතාවට පවත්නා අයිතිය තෝරාගත් අරමුණු වලට පමණක් සීමා වී පවතී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇසුරින් ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

*****